ඉරිදා ලංකාදීප
රජරට
2022 මාර්තු මස 13 වැනිදා ඉරිදා ★★

# රත්තරන් උගස් කිරීම විකිණීම ඉහළ ගිහින්

- ළදරුවන්ගේ පංචායුද හා කුඩා කරාබු පවා දැන් විකුණනවා
- අවුරුද්දක විතර සිට රත්තරන් මිලදී ගන්නේම නෑ
- අවුරුදු 30 ක් ඇතුළත මං මෙවැනි තත්ත්වයක් දැකලාම නෑ

## මැදවච්චිය වෙළෙඳ හා කර්මාන්ත මණ්ඩලයේ සභාපති නෂාර් හෙළිකරයි



(අනුරාධපුර සමන්ත ලීලාරත්න)

**මැදවච්චිය ප්‍රදේශයේ ජනතාව වසරක පමණ කාලයක සිට ඔවුන් සතු රත්තරන් ආභරණ උකස් කිරීමට සහ විකිණීමට වැඩි වශයෙන් පෙළඹී සිටින බව මැදවච්චිය වෙළෙඳ හා කර්මාන්ත සංගමයේ සභාපති ෂාවුල් හමීඩ් නෂාර් මහතා පවසයි. මේ පිළිබඳව ඉරිදා ලංකාදීප රජරටට වැඩිදුරටත් අදහස් දැක්වූ ඒ මහතා මෙසේ ද පැවසීය.**

මම වසර තිහක පමණ කාලයක් තිස්සේ මැදවච්චිය නගරයේ ස්වර්ණාභරණ අලෙවියේ නිරත වෙනවා. මේ අවට ගම්මාන සිය ගණනක දහස් ගණන් ජනතාව පසුගිය කාලය තුළ මගේ ආයතනයෙන් රත්තරන් මිලදී ගත්තා. නමුත් දැන් වසරක කාලයක ඉඳලා ජනතාව රත්තරන් මිල දී ගන්නෙම නැති තරම්.

වෙනද රත්තරන් මිල දී ගන්න ආපු ජනතාව දැන් ජුවලරිවලට, බැංකුවලට මුල්‍ය ආයතනවලට එන්නේ රත්තරං උගස් කරන්න නැතිනම් විකුණා දමන්න. වගා කන්නයක් ආරම්භ වෙනකොට ජනතාව සතු මුදු, කරාබු, මාල, වළලු බැංකු සහ වෙනත් ආයතනවලට උකස් කරලා ඒ මුදල් වගාවන්ට වැය කරනවා. අස්වැන්න ලබා ගත්තාම නැවත ඒවා බේරා ගන්නවා. අවුරුද්දේ සැම කාලයකදීම ජනතාව පුළු පුළුවන් විදිහට රත්තරන් ආභරණ මිල දී ගැනීමට හුරු වෙලා තිබුණා. ජනතාව ඔවුන් සතු රත්තරන් විකුණුවේ බොහොම කලාතුරකින්.

නමුත් මේ වෙනකොට කුඩා දරුවන්ගේ පංචායුධ සහ කුඩා කරාබු පවා දෙමාපියන් විසින් උගස් කරන්න විකුණා දමන්න බැංකු සහ මූල්‍ය ආයතනවලට අරගෙන එනවා. ජනතාව සතු මාල, වළලු, මුදු, කරාබු උකස් කරලා පුළුවන් කාලයේ බේරාගන්න එන එක සාමාන්‍ය දෙයක්. නමුත් කුඩා දරුවන්ගේ පංචායුධ සහ කුඩා කරාබු උගස් කරනවා හා විකුණනවා කියන්නේ ඉතා කනගාටුදායක තත්ත්වයක් බවද ඒ මහතා වැඩිදුරටත් පැවසීය.

## තලාව ප්‍රාදේශීය සභාවේ
# පොහොට්ටුවේ මන්ත්‍රී හේරත් ජ.වි.පෙට



(රාජාංගණය - නුවන් කුමාර)

තලාව ප්‍රාදේශීය සභාවේ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ නියෝජනය කරන අබේරත්න හේරත් මන්ත්‍රීවරයා ජනතා විමුක්ති පෙරමුණට එක්වීමට නියමිත බව ඉරිදු ලංකාදීප රජරටට වාර්තා වෙයි.

1991 වර්ෂයේ පැවැති පළාත් පාලන මැතිවරණයේ දී ශ්‍රී ලංකා නිදහස් පක්ෂ මන්ත්‍රීවරයෙක් වශයෙන් පත්වූ ඒ මහතා එතැන් පටන් පැවැති සෑම පළාත් පාලන මැතිවරණයකදීම වැඩිම ඡන්ද හිමිකරගෙන පුරා වසර 31ක් තලාව ප්‍රාදේශීය සභාව නියෝජනය කරයි.

නිකැලැල් දේශපාලනයකට හිමිකම් කියන ඒ මහතා සෑම විටම දූෂණයට, වංචාවට හා අසාධාරණයට එරෙහිව සටන් කරන මන්ත්‍රීවරයෙකි. තලාව ප්‍රාදේශීය සභාවේ දිගින් දිගටම සිදුවූ වංචා හෙළි කිරීමට දැඩි වෙහෙසක් ගත් ඒ මහතා පසුගිය කාලය පුරාවටම පවතින දේශපාලන වාතාවරණය පිළිබඳව දැඩි කලකිරීමෙන් සිටියෙකි.

ජනතා විමුක්ති පෙරමුණේ ඉහළ පෙළේ නායකයන් සමග මේ වනවිට සාකච්ඡා වට කිහිපයක් පවත්වා ඇති බවත් ඒ සාකච්ඡා ඉතා සාර්ථක බවත් මන්ත්‍රීවරයාට සමීප ආරංචි මාර්ගවලින් ඉරිදු ලංකාදීප රජරටට වාර්තා වෙයි.

මේ සම්බන්ධයෙන් අබේරත්න හේරත් මහතාගෙන් කළ විමසුමක දී ඒ මහතා මෙසේ පැවසීය.

මගේ අදහස්වලටවත් ප්‍රතිපත්තිවලටවත් ගැළපෙන පාලන තන්ත්‍රයක් තලාව ප්‍රාදේශීය සභාව තුළ නැහැ. මේ සභාවේ දැනට ඉන්න පාලකයනුත් හිටිය අයත් දුෂ්ටත්වයෙන් පිරිච්ච දස අකුසල්වලින් පිරිච්ච පාලන කණ්ඩායමක්. මම අදහන ආගමට අනුව මෙයාලා කරන්නේ අකුසල කර්මයක්. මේ ආයතනයේ සිදුවන වංචා පිළිබඳව වගකිවයුතු ආයතන එකකින්වත් නිසි විමර්ශනයක් වෙන්නේ නැහැ. සමස්තයක් විදිහට ගත්තාම ලංකාවේ පළාත් පාලන ආයතන කඩා වැටිලා තියෙන්නේ. මධ්‍යම ආණ්ඩුවේ ඉන්න ඇමැතිවරයා දන්නේ නැහැ තමන්ගේ වගකීම මොකක්ද කියලා. පළාත් සභාවේ ඉන්න ආණ්ඩුකාරවරයා පාණ්ඩුකාරයෙක් වගේ තමන්ගේ වගකීම දන්නේ නැහැ. මම ලොව්තුරා බුදුන් වහන්සේගේ ධර්මයට අනුව ජීවත් වෙන්නෙක්. උන්වහන්සේගේ ධර්මට ගැළපෙන පාලනයක් දකින්න මම කැමතියි. මේක රට දැඩි අගාධයකට වැටුණු අවස්ථාවක්. අපි විද්වතුන් යැයි හිතාගත්ත කණ්ඩායමත් කරන්නේ බොරුවක්. බිම් මට්ටමේ ජනතාව දැන් ඉන්නේ කොහෙද කියලා කාටත් පැහැදිලියි. මම ජනතා විමුක්ති පෙරමුණට සම්බන්ධවීම සම්බන්ධයෙන් හැමදම මට ඡන්දය දුන්න ජනතාවගෙන් ඇහැව්වොත් ඔබතුමාට පිළිතුරක් ලැබේවි' යි මන්ත්‍රීවරයා කියයි.

# වී කිලෝවට රුපියල් 25 වන්දිය එපා
# අක්කරයකට ලක්ෂයක වන්දියක් ඕනෑ

## එච් කලාපීය ගොවි සංවිධාන එකමුතුවේ හිටපු සභාපති දිසානායක ඉල්ලයි

(රාජාංගණය - නුවන් කුමාර)

පෙර කන්නවලට වඩා අස්වැන්න අඩුවෙන වී කිලෝවකට කෘෂිකර්ම ඇමැති කියන රුපියල් 25 වන්දිය තමන් ප්‍රතික්ෂේප කරන බව මහවැලි එච්. කලාපීය ගොවි සංවිධාන එකමුතුවේ හිටපු සභාපති ඩී. එම්. දිසානායක මහතා පවසයි.

**ඉරිදු ලංකාදීප - රජරටට අදහස් දක්වමින් මේ බව කී ඒ මහතා වැඩිදුරටත් මෙසේ ද පැවසීය.**

රසායනික පොහොර නියමිත පරිදි නොතිබුණු හින්ද මෙද මාස් කන්නයේ වී අස්වැන්න70%කින් පහත වැටිලා. ඒක දැන් ගොයම් කපන පැතිවල අස්වැන්නෙන් පැහැදිලිව පේනවා. පහුගිය කන්නවල අක්කරයකින් වී බුසල් 100 ක අස්වැන්නක් ලැබුණා. එතකොට මහවැලි කලාපයේ හෙක්ටයාරයකින් වී කිලෝ 5000ක අස්වැන්නක් ගන්න පුළුවන් වුණා. ගොයම් කපන තැන්වලින් වාර්තා වන විදිහට අපිත් බලාපොරොත්තු විය යුත්තේ හෙක්ටයාරයකින් වී බුසල් 1500යි. ඒක පැහැදිලියි. මොකද ගොයමට දින 75ත් 90ත් අතර කාලයක් ගත වෙලා තිබුණත් තවමත් ගොයම් පීදිලා නැහැ. කහම කහ පාටයි. කුරු වගේ ගොයම් ගහ උඩට ඉස්සිලා තියෙන්නේ.

ඒ අනුව මහවැලි ගොවියකුට මෙද පාර වී කිලෝ 3500ක් අඩු වෙනවා. කෘෂිකර්ම ඇමැති කියන විදිහට ඒ අඩුවෙන වී කිලෝවකට රුපියල් 25ක වන්දියක් ගෙව්වත් ගොවියට ලැබෙන්නේ රුපියල් 87,500යි. සාමාන්‍යයෙන් හෙක්ටයාරයක් හාන්න රුපියල් 30,000යි. කපලා පාගන මැෂිමට රුපියල් 30,000යි. නියර රහින්න, නියර බඳින්න, වී වපුරන්න, බිත්තර වීවලට, කෘමිනාශක, වල්නාශකවලට යන වියදම රුපියල් 75,000ක් වෙනවා. එතකොට අක්කර දෙක හමාරට රුපියල් 135,000 වැය වෙනවා. ගොවියා මේ මුදල හොයාගන්නේ රත්තරන් බඩු උගස් කරලා. එහෙම නැත්නම් බැංකුවෙන් ණයක් අරගෙන. අපි කියන්නේ ඇමැති කියන වී කිලෝවට ගෙවන රුපියල් 25 වන්දිය වෙනුවට අක්කරයකට රුපියල් ලක්ෂයක වන්දියක් දෙන්න කියලයි.

අර දියර පොහොර දෙපාරක් යෙදුවා. ඒත් හරි ගියේ නැහැ. ගොවියට ඒවා ලැබුණෙත් දින 40ක් ගත වුණාට පස්සේ. ඇමැති කියන පොහොර වර්ග 4 අපිට දුන්නේ නැහැ. අපිට දුන්නේ ඔය ගඳගහන දියර පොහොර ටිකයි, එම්.ඕ.පී. එකයි විතරයි. කොම්පෝස්ට් හදන්න දෙනවා කිව්වා රුපියල් 12,500න් ලැබුණේ රුපියල් 7,500යි. ඒකත් සීයට 25කට ශත පහක්වත් ලැබිලා නැහැ. කරපු විකාර වැඩේ හින්ද මහවැලි එච්. කලාපයේ ගොවි පවුල් 40,000ක් අනාත වුණා යැයි ද දිසානායක මහතා වැඩිදුරටත් කියා සිටියේය.

# අක්කරයක අස්වැන්න වී බුසල් 20-30 බැහැලා
## වෙනදා අක්කරයකින් වී බුසල් 90-100 ක් ගත්තා
### සංගිලිකනදරාව සෙවණ ගොවි සංවිධානය කියයි

(අනුරාධපුර සමන්ත ලීලාරත්න)

මැදවච්චිය ගොවිජන සේවා බල ප්‍රදේශයේ සුළු වාරිමාර්ග සහ මධ්‍ය වාරිමාර්ග යටතේ මෙවර මහ කන්නයේ වගා කළ බහුතරයක් කුඹුරුවලින් අක්කරයකින් ලබාගත හැකිව තිබෙන්නේ වී බුසල් 20ක් 30ක් වැනි අවම අස්වැන්නක් බව මැදවච්චිය සංගිලිකනදරාව සෙවණ ගොවි සංවිධානයේ ගණන් පරීක්ෂක එන්. නිමල් රත්න මහතා පවසයි.

**මේ පිළිබඳව ඉරිදු ලංකාදීප රජරටට වැඩිදුරටත් අදහස් දැක්වූ ඒ මහතා මෙසේ ද පැවසීය.**

මේ ප්‍රදේශයේ කුඹුරුවලින් වෙනත් කන්නවල දී අක්කරයකින් වී බුසල් 90ත් 100ත් අතර ප්‍රමාණයක් ලබාගන්න පුළුවන්. නමුත් මේ කන්නයේ එහෙමත් කුඹුරකින් තමයි අක්කරයකින් වී බුසල් 40ක් 50ක් ගන්න හැකි වුණේ. ඒ ප්‍රමාණය ගන්න පුළුවන් වුණේ හරියට වල් මර්දනය කරගෙන යූරියා පොහොර ටිකක් ගහපු කුඹුරුවලින් පමණයි. මේ ප්‍රදේශයේ සමහර ගොවීන් දරුවන්ගේ කනකර බඩු උකස් කරලා රුපියල් 20,000 සිට 25,000 අතර ගණනකට යූරියා කිලෝ 50ක මිටියක් ගත්තා. එහෙම කරපු අයට තමයි ඔය විදිහට හරි වී ටිකක් ගන්න පුළුවන් වුණේ.



මැදවච්චිය සංගිලිකනදරාව සෙවණ ගොවි සංවිධානයේ ගණන් පරීක්ෂක එන් නිමල් රත්න

මමත් මගේ අක්කර 3 ක වී වගාවට මමම හදලා කොම්පෝස්ට් පොහොර කිලෝ 700 ක් දැම්මා. නමුත් ගොයමේ කිසිම වර්ධනයක් වුණේ නෑ. මේ වතාවේ අක්කර තුනක් වගා කරන්න රුපියල් ලක්ෂ එකහමාරක් විතර වැය වුණා. නමුත් වියදමවත් ගන්න හැකියාවක් නෑ.

වෙළෙඳ පොළේ කිරි සම්බා රුපියල් 115යි, නාඩු 90ට, සම්බා 90 වගේ මිලකට ගොවියන්ගෙන් මිල දී ගන්නවා. නමුත් අක්කර දෙක තුනක වගා කළ ගොවියාට වෙළෙඳපොළට අලෙවි කරන්න වී ඇත්තේම නැයි ඒ මහතා වැඩිදුරටත් පැවසීය.


## රැකියා ඇබෑර්තු

අනුරාධපුර වාහන සර්විස් කරන ආයතනයකට
- ★ වාහන සේදීමට - නුපුහුණු පිරිමි
- ★ ඉන්ටීරියර් ක්ලීනින් - පුහුණු පිරිමි
- ★ වාහන බොඩි පොලිෂ් - වසර 2 පළපුරුද්ද
- ★ වීල් එලයිමන්ට් 3D - පුහුණු
- ★ මැකැනික් හයිබ්‍රිඩ් - පුහුණු
- ★ වාහන ඉලෙක්ට්‍රිෂියන් හයිබ්‍රිඩ් - පුහුණු

වහාම බඳවාගනු ලැබේ.

විමසීම්: 0777 775 465

විදේශීය කාන්තාවක් පවත්වාගෙනයන
විදේශිකයින්ට නවාතැන් සපයන
සංචාරක බංගලාවකට සරල
ඉංග්‍රීසි දැනුමැති 38 - 45 අතර
කාන්තාවන් දෙදෙනෙකු අවශ්‍යයි.
077 5376325

## අනුරාධපුර

නගර මධ්‍යයේ ආරක්ෂිත පරිසරයක පිහිටි අධ්‍යාපන ආයතනයක් සඳහා පරිගණක දැනුම ඇති කළමනාකරණ සහකාරවරියන් වහාම අවශ්‍යයි.

ඉහළ වැටුප් 24,000 + EPF

විමසීම්:
0770 765 634

No. 524/28
නව බස්නැවතුම්පල අසල
4 වන පටුමග
අනුරාධපුර

## Vacancy For Anuradhapura
## ඇබෑර්තු
# ගබඩා පාලක
## Store Keeper

ශ්‍රී ලංකාවේ ප්‍රධාන පෙළේ ඖෂධ බෙදාහරින සමාගමක් වන අප සමාගමේ අනුරාධපුර ශාඛාව සඳහා ගබඩා පාලකවරුන් බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

සුදුසුකම්
- අ.පො.ස (උ.පෙළ) සමත්, වයස අවු .45 ට අඩු (පිරිමි).
- ගබඩා පාලක ලෙස අවම වශයෙන් වසර 02 ක සේවා පළපුරුද්ද.
- පරිගණක ක්‍රියාකරවීමේ හැකියාව සහ ඖෂධ ගබඩාවක සේවය කර තිබීම විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

තෝරා ගන්නා අයදුම්කරුවන් සඳහා
ආකර්ෂණීය වැටුප් සමග
වාර්ෂික ප්‍රසාද දීමනා සහ සුභ සාධන ප්‍රතිලාභ හිමිවේ.
ඔබගේ ජීව දත්ත තොරතුරු ඇතුලත් අයදුම්පතක් දින 14 කට ප්‍රථම අප වෙත එවන්න.

The Deputy General Manager
Shan Pharma Holdings (Pvt) ltd
No.601/72 L, Thammannakulama, Anuradhapura.
Tel:077 0378888
Email: asanka@shanpharmah.com

# අයි.ටෙක් පුහුණු මධ්‍යස්ථානය
## පුහුණු පාඨමාලා සඳහා නවක සිසුන් බඳවා ගැනීම 2022

තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි අයි.ටෙක් පුහුණු මධ්‍යස්ථානය පහත NVQ 3 සහ 4 මට්ටමේ පාඨමාලා සඳහා බඳවා ගැනීම් දැන් සිදු කරනු ලැබේ.

වෘත්තීය පුහුණු පාඨමාලා
- පරිගණක යෙදුම් සහයක - (මාස 06) Computer Application Assistant
- තොරතුරු සංනිවේදන තාක්ෂණ ශිල්පී (මාස 06) ICT Technician
- මෘදුකාංග සංවර්ධනකරු ( මාස 12) Software Developer
- දෘඩාංග හා ජාලකාර්මික ශිල්පී ( මාස 12) Hardware and Network Technician
- වෙබ් අඩවි නිර්මාණ ශිල්පී (මාස 06) Web Designer
- ජංගම දුරකථන අලුත්වැඩියාව (මාස 04) Mobile Phone Repair
- ආරක්ෂණ සහ නිරීක්ෂණ පද්දති කාර්මික ශිල්පී (මාස 04) Security & Surveillance System Technician (CCTV)

NVQ 3 & 4

***තෝරාගත් පාඨමාලා සඳහා රාජ්‍ය මූල්‍ය අනගහකත්වය සමගින්***

රැකියාගත පුහුණුව NAITA මගින්

ඉහත ක්ෂෙත්‍ර පිළිබද උනන්දුවක් දක්වන ඕනෑම අයෙකුට ඉල්ලුම්කල හැකිය

I.TECH The Best IT Training Provider

521/5,මෛත්‍රිපාල සේනානායක මාවත, නව නගරය, අනුරාධපුර
0252056850, 0776549101

තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි අංකය - P16/0098

# ජංගම දුරකතනයේ තිරයෙන් සෞඛ්‍යයට වෙන හානි ඉහළයි

## අක්ෂි ශල්‍ය වෛද්‍ය විශේෂඥ භාග්‍යා වීරසිංහ

**විද්‍යුත් පරිගණක තිර හා ස්මාට් ජංගම දුරකතන තිර ඉදිරිපිට වැඩි කාලයක් ගතකරන පුද්ගලයන් පරිගණක දෘෂ්ටි සහලක්ෂණය (computer vision syndrome) නමැති රෝගීතාවයට ගොදුරුවීමේ වැඩි අවදානමක් පවතින බව අනුරාධපුර ශික්ෂණ රෝහලේ අක්ෂි ශල්‍ය වෛද්‍ය විශේෂඥ භාග්‍යා වීරසිංහ මහත්මිය කියයි.**

ඉරිදු ලංකාදීප රජරට සමග සාකච්ඡාවකට එක්වෙමින් මේ බව කී වීරසිංහ මහත්මිය වැඩිදුරටත් මෙසේද කීවාය.

පරිගණක දෘෂ්ටි සහලක්ෂණය කියන රෝගයෙන් පෙළෙන රෝගීන් ලොව පුරා මිලියන හැටකට අධික සංඛ්‍යාවක් සිටිනවා. 2015 දී කළ සමීක්ෂණයකින් එය තහවුරු කරගෙන තියෙනවා. ඒත් එක්කම ඒ සමීක්ෂණයෙන් හෙළිකරගෙන තියෙනවා සෑම වසරකම මිලියනයක් පමණ අලුතෙන් රෝගීන් වාර්තාවන බවට. මේ රෝගය සම්බන්ධව ගොඩාක් අය දැනුවත් නැහැ. අපි අතරත් එවැනි රෝගීන් ඉන්න පුළුවන්. මෙහි එන රෝග ලක්ෂණ එක එක්කෙනාට වෙනස් වෙනවා. ගොඩක් රෝගීන් ආරම්භයේදී ප්‍රතිකාර සඳහා යොමුවෙන්නේ නැහැ. දිනකට පැය දෙකක් අඛණ්ඩව විද්‍යුත් තිර භාවිතා කිරීම මෙම පරිගණක තිර සහලක්ෂණය ඇතිකිරීමට ප්‍රමාණවත් බව ඇමෙරිකාවේ දෘෂ්ටි විශේෂඥයින්ගේ සංගමය මගින් පෙන්නුම්කර තිබෙනවා.

ඇසේ සෞඛ්‍ය තත්ත්වය ගැන සඳහන් කිරීමේදී කාරණා දෙකක් වැදගත්. ඒ විශේෂයෙන් දැසේ පෙනීම නිසියාකාරව පවතිනවාද කියන කාරණය හා ඇස කිසිදු වේදනාවකින් හෝ අපහසුවකින් තොරව පවතිනවාද කියන කාරණය. පරිගණක තිර සහලක්ෂණය වශයෙන් හඳුන්වන්නේ රෝග ලක්ෂණ කිහිපයක එකතුවක්. ඇසෙහි ඇතිවන වියළි බව, විටින් විට ඇස් රතුවීම, ඇස් කෙවීම, ඇස් කැසීම, නිතර නිතර කඳුළු එන තත්ත්වය, ආලෝකය දෙස බැලීමේ අපහසු බව, ඇසෙහි ඇතිවන වෙහෙසකර බව, විටින් විට පෙනීමෙහි ඇතිවන බොඳ ගතිය සහ හිසරදය මෙහි රෝග ලක්ෂණයන්.

පරිගණක තිරයක් හෝ විද්‍යුත් තිරයක් ඉදිරියේ අඛණ්ඩව වැඩිවේලාවක් ගතකරන විට ඇසෙහි කඳුළු වාෂ්ප වී ඇස වියළිභාවයට පත්වෙනවා. ඇසේ කඳුළු ස්ථරය තමා ඇසේ සෛලවලට අවශ්‍ය ජලය, පෝෂ්‍ය පදර්ථ රැගෙන යන්නේ. ඒ වගේම බහිස්‍රාවීය ද්‍රව්‍ය ඇසෙන් ඉවත් කරන්නත් ඒ ස්ථරය වැදගත් වෙනවා. ඇසේ කඳුළු වාෂ්ප වී වියළි තත්ත්වයට පත්වූ විට ඇසේ මතුපිටට අවශ්‍ය පෝෂ්‍ය කොටස් යන්නේ නැහැ. ඇසේ ඇති බහිස්‍රාව්‍ය ද්‍රව්‍ය පිටවීම සිදුවන්නේ නැහැ. එමගින් ඇස මතුපිට ඇති සෛලවලට හානි සිදුවීම මගින් ඉහත කී රෝග ලක්ෂණ ඇතිවෙනවා.

නිවැරදි ප්‍රතිබිම්භයක් හදන්න කඳුළු ස්ථරයයි වාතයයි අතර ඇතිවන වර්තනය ඉතාම වැදගත්. ඇසෙහි වියළි බව නිසා එය නිසියාකරව සිදු නොවීම මගින් නිවැරදි ප්‍රතිබිම්භයක් හැදෙන්නේ නැහැ. ඒ වෙලාවට රූපය බොඳවෙලා පේන්නේ. හරියට රූපය, දර්ශනය අඳුනගන්න අමාරුයි. අපහසුවෙන් බලනවිට ඇසෙහි වේදනාවක් මෙන්ම හිසරදය ද ඇතිවෙනවා. ඔබ ඉගෙන ගන්න කෙනෙක් නම්, අධ්‍යාපන වැඩවලට බාධාවෙනවා. රැකියාවක නිරතවන පුද්ගලයෙක් නම් ඔබගේ ඉලක්කවලට බාධා ගොඩයි.

සාමාන්‍යයෙන් පුද්ගලයෙක් විනාඩියකට පහළොවත්, විස්සත් අතර වාර ගණනක් ඇස්පිල්ලන් ගහනවා. මෙය කවුරුවත් දන්නෙම නැතිව සිදුවෙන ක්‍රියාවලියක්. ඒත් පරිගණකයක් ඉදිරිපිට ඉන්න අයකු විනාඩියකට ඇසිපිල්ලන් ගහන වාර ගණන නොදැනුවත්වම වාර පහකට, හයකට සීමා වෙනවා. එසේ සිදුවුණහම ඇසේ තියෙන ජලය වාෂ්පවීම වේගවත්ව සිදුවෙනවා. ඒ නිසා පරිගණක තිරයක් ඉදිරිපිට සිටින අයෙක් වැඩිවාර ගණනක් සිතා මතා ඇසිපිල්ලන් ගැසීම වැදගත්. පරිගණකයක් ළඟ එක දිගට වැඩි වේලාවක් රැඳෙන සෑම අයෙක්ම (20 -20 -20 නීතිය) විනාඩි විස්සකට වරක් අවම වශයෙන් තත්පර විස්සක කාලයක් ඇසට අඩි විස්සක ඈතින් දුරක් දිහා බලාගෙන සිටිය යුතුයි. නමුත් පුද්ගලයෙක් පැය දෙකකට වඩා වැඩි කාලයක් එක දිගට විද්‍යුත් තිරයක් ඉදිරිපිට ඉන්නවා නම් ඒ තැනැත්තා විනාඩි පහළොවකවත් විවේකයක් ඇසට ලබාදෙන්න ඕනේ. ඇසේ කඳුළු වේළෙන තත්ත්වයට පත්වී ඇති රෝගීන් වැඩිපුර වතුර පානය කරන්න අවශ්‍යයි. ඒ වගේම කඳුළු ස්ථරයට අවශ්‍යවන විටමින් ඒ.සී.ඩී.ඊ. අඩංගු ආහාර වැඩිපුර ගන්න අවශ්‍යයි. ඒ සඳහා කැරට්, වට්ටක්කා, නිවිති, කිරි සහිත ආහාර, චීස්, යෝගට්, බිත්තර වැනි ආහාර දිනපතා ආහාරයට එක්කර ගත යුතුයි.

විද්‍යුත් තිරවලින් නිල් පැහැති ආලෝක කදම්භ (blue-rays) පිටවෙනවා. පුද්ගලයෙක් දවල්ට ඇහැරගෙන ඉඳලා රාත්‍රියට නිදගන්නවා කියන්නේ ස්වභාවික ඔරලෝසුවක් වගේ ක්‍රියාවලියක්. එය පාලනය වෙන්න නිල් ආලෝක කදම්බ වැදගත් වෙනවා. විශේෂයෙන් ළමයින් නිදගැනීමට අවම වශයෙන් පැයකට කලින්වත් විද්‍යුත් තිර භාවිතයෙන් ඉවත්වෙන්න ඕනේ. මේ නිල් ආලෝක කිරණ මගින් නින්දට අවශ්‍ය වන හෝමෝන ශ්‍රාවයන් අඩුකරනවා. එවිට නින්ද

**ඇසෙහි ඇතිවන වියළි බව, විටින් විට ඇස් රතුවීම, ඇස් කෙවීම, ඇස් කැසීම, නිතර නිතර කඳුළු ඒම, ආලෝකය දෙස බැලීමේ අපහසු බව, ඇසෙහි ඇතිවන වෙහෙසකර බව, විටින් විට පෙනීමෙහි ඇතිවන බොඳ ගතිය සහ හිසරදය රෝග ලක්ෂණයි.**



යාම ප්‍රමාද කරනවා වගේම හොඳ නින්දක් ලැබෙන්නෙත් නැහැ. මේ තත්ත්වය දරුවන්ට සිදුවුණහම ඒ අයට පසුවදට නිදිමත එනවා. පාසලේ වැඩ නිසියාකාරව කරගන්න බැරිවෙනවා. එය දරුවන්ගේ වර්ධනයට මෙන්ම නිරෝගීකමටත් බලපානවා.

දරුවන්ගේ ඇසෙහි සෞඛ්‍ය ගැන කතා කිරීමේදී පරිගණක දෘෂ්ටි සහලක්ෂණයට අමතරව අවිදුර දෘෂ්ටිකත්වය (myopia) යන වර්තන ආබාධ තත්ත්වය ගැන කතාකළ යුතුමයි. ආලෝක කදම්භ ඇස හරහා යැමේදී වර්තනය කියන ක්‍රියාවලියට ලක්වී තමයි දෘෂ්ටි විතානය මත නාභිගත වෙන්නේ. ඒ ක්‍රියාවලියේදී ඇතිවන විවිධ ආබාධ තත්ත්වයන් වර්තන ආබාධ ලෙස හඳුන්වනවා.මෙයින් අවිදුර දෘෂ්ටිකත්වය (myopia ) යන ළඟ පෙනීම සහ දුර නොපෙනීම යන වර්තන ආබාධ තත්ත්වය වර්තමානයේ ලොවපුරා වසංගතයක් ආකාරයෙන් (global epidemic) ව්‍යාප්තවෙලා තියෙනවා. 2010 වර්ෂයේදී ලොව මුළු ජනගහනයෙන් සියයට තිහකට ආසන්න පිරිසක් මෙම අවිදුර දෘෂ්ටිකත්වය නමැති වර්තන ආබාධ තත්ත්වයට ගොදුරුවෙලා තියෙනවා. ඒ තත්ත්වය 2030 වසර වනවිට සියයට හතළිහ දක්වාත් 2050 වන විට සියයට පනහ දක්වාත් වර්ධනය විය හැකි බව සමීක්ෂණ වාර්තා මගින් පෙන්වා දෙනවා.

අවිදුර දෘෂ්ටිකත්වය සඳහා හේතුවන අවදානම් කරුණු කිහිපයක් තියෙනවා. ජානවල බලපෑම් වගේම පාරිසරික සාධකත් බලපානවා. වර්තමානයේ අපේ දරුවෝ එළිමහනේ ගතකරන කාලය ඉතාමත්ම අඩුයි. නිවසක් තුළම ගතකරනවිට දරුවන් බොහෝ වෙලාවට යොමුවී තිබෙන්නේ ළඟ වැඩ කිරීම සඳහා පමණයි. දරුවන් එළිමහනේ ගත කරනවිට ඔවුන්ගේ ඇස නිතරම ඈත තිබෙන වස්තූන් දෙස යොමුවී පවතිනවා. මෙමගින් ඇසේ මාංශපේශී සැහැල්ලු වෙනවා. නමුත් නිතරම ළඟ වැඩවල නිරතවන විට ඇස්වලට ලොකු වෙහෙසක් යෙදීමට සිදුවෙනවා.

මෙලෙස එළිමහනේ ගතකරන කාලය අඩුවී දවසේ වැඩිපුර වේලාවක් ළඟ පෙනීම අවශ්‍යවන ක්‍රියාකාරකම්වල යෙදීම අවිදුර දෘෂ්ඨිකත්වය සඳහා බලපාන අවදානම් කරුණු ලෙස හඳුනාගෙන තිබෙනවා. කොටින්ම කිවහොත් නාගරීකරණය වීම මෙයට හේතුවී තිබෙනවා. මයෝපියා තත්ත්වය දීර්ඝ කාලයක සිට කතාකරන දෙයක් වුවත් වර්තමානයේ වැඩි අවධානයක් යොමුවී තිබෙන්නේ කොවිඩ් වසංගතයත් එක්ක. සමාජ දුරස්ථභාවයත් සමග විද්‍යුත් තීර භාවිතයෙහි ශීඝ්‍ර වර්ධනයක් දක්නට ලැබෙනවා.

සමහර වෙලාවට ගම්බද දරුවන්ට වුණත් ක්‍රීඩා පිටියකට ගිහින් සෙල්ලම් කරන්න අවස්ථාවක් පසුගිය වසර එකහමාරක කාලයේදි උදාවුණේ නැහැ. නිවස ඇතුළටම වෙලා ඉන්න නිසා බලන්න හැකියාව තියෙන්නේ බිත්ති සීමාවට විතරයි. ඈත තියෙන දෙයකට ඇස යොමුකරන්න ලැබුණු අවස්ථාව අඩුවුණා. එය දැන් අවදනම් කරුණක් බවට පත්වෙලා. මෙහි බලපෑම කෙටිකාලීනව අද, හෙට කියා ගණනය කරන්න අමාරුයි. වසර දෙකක්, තුනක් ගතවන විට එහි ප්‍රතිඵල සමීක්ෂණ වාර්තාවලින් දැකගන්න පුළුවන්කම ලැබෙයි.

**පරිගණකයක් ළඟ එක දිගට වැඩි වේලාවක් රැඳෙන සෑම අයෙක්ම විනාඩි විස්සකට වරක් අවම වශයෙන් තත්පර විස්සක කාලයක් ඇසට අඩි විස්සක දුරින් තියෙන දෙයක් දෙස බලාගෙන සිටිය යුතුයි. පැය දෙකකට වැඩි කාලයක් එක දිගට විද්‍යුත් තිරයක් ඉදිරිපිට ඉන්නවා නම් ඒ තැනැත්තා විනාඩි පහළොවකවත් විවේකයක් ඇසට ලබාදෙන්න ඕනේ.**

දරුවකුට අවිදුර දෘෂ්ටිකත්වය යන වර්තන ආබාධ තත්ත්වය ඇති බවට හඳුනාගන්නේ කොහොමද කියන කාරණය හරිම වැදගත්. පොතක් කියවනවිට පොත ඉතාම ඇස කිට්ටුවට අරගෙන බලනවා නම් හෝ දරුවා රූපවාහිනිය නරඹන විට රූපවාහිනී තිරය අසලටම ගොස් බලන්නේ නම් ඒ දරුවා මෙම අවිදුර දෘෂ්ටිකත්වය තත්ත්වයෙන් පෙළෙනවා වියහැකියි. තමන්ගේ දරුවා නිතරම කියනවා නම් ඈත පේන්නේ නැහැ, ඈත කවුද ඉන්නේ කියලා අඳුරගන්න බැහැ කියලා, ඒ ගැන වැඩි අවධානයක් යොමුකළ යුතුම වෙනවා. සමහර දරුවෝ පාසල් ගියහම අකුරු හරියට ලියන්නේ නැහැ. ලියන අකුරුත් වැරදියටයි ලියන්නේ. මෙවැනි දරුවන් ගැන විශේෂ අවධානයක් යොමු කළයුතු වෙනවා. ඇසේ වපර තත්ත්වයත් දෘෂ්‍යාබාධයෙන් පෙළීමේ රෝග ලක්ෂණයක්. දෑස් නිසියාකාරව නොපෙනෙන විට එය ළමයින්ගේ අධ්‍යාපන කටයුතුවලට මෙන්ම ඒ අයගේ මානසික හා සමාජීය වර්ධනයට ද බලපානවා.

මෙවැනි දෘෂ්‍යාබාධ රෝග ඇති දරුවන්ට ප්‍රතිකාර කරන්නේ කෙසේද කියන කාරණය ඉතාම වැදගත්. ඒ සඳහා නිවැරදි අක්ෂි පරීක්ෂාවක් මගින් වර්තන ආබාධ තත්ත්වයක් ඇති බවට හඳුනාගැනීම අවශ්‍ය වෙනවා. නිවැරදි කන්නාඩියක් පැළඳවීම මගින් නිවැරදි ප්‍රතිබිම්භයක් ඇසේ සිවිය මත පතිත කිරීමට හැකියාව පවතිනවා.

ඇසේ තරංග මොළයට ගියහම තමයි රූප හඳුනාගන්නේ. ළමා වයසේදී ඇසේ පෙනීම නිසියාකාරව සිදුනොවෙනවා නම් පෙනීම පිළිබඳ තරංග නිසියාකාරව මොළයට ගමන් නොකිරීම හේතුවෙන් මොළයේ උද්දීපනය අඩුවෙනවා. එවැනි අවස්ථාවල මොළය වර්ධනය වන්නේ අඩුපෙනීමේ තත්වයකටයි. මෙම තත්ත්වය amblyopia ලෙස හඳුන්වනවා. මේ තත්ත්වය උපතේ සිට වයස අවුරුදු හත දක්වා කාලය තුළ සිදුවෙනවා.

ඒ නිසා මොළය වර්ධනය වන කාලයේදී ළමයකුට යම් දෘෂ්‍යාබාධ තත්ත්වයක් ඇතිවුණොත් එයා ඒ කාලයේදී කන්නාඩි පළඳින්න අවශ්‍යයි. නැතිව තරුණ වයසට පත්වෙලා කන්නාඩි දැමීමෙන් ප්‍රතිඵලයක් ලබාගන්න බැහැ.

**නිදාගැනීමට අවම වශයෙන් පැයකට කලින්වත් විද්‍යුත් තිර භාවිතයෙන් ඉවත්වෙන්න ඕනේ. නිල් ආලෝක කිරණ මගින් නින්දට අවශ්‍ය වන හෝමෝන ශ්‍රාවයන් අඩුකරනවා. එවිට නින්ද යාම ප්‍රමාද කරනවා වගේම හොඳ නින්දක් ලැබෙන්නෙත් නැහැ.**

අපේ මාපියන් දැනගත යුතුම දෙයක් තමා පොඩි වයසේදීම තමන්ගේ දරුවාට කන්නාඩි පැළඳිය යුතු රෝගී තත්ත්වයක් තියෙනවා නම් එය ඒ අවස්ථාවේදීම සිදුකිරීම අවශ්‍යම දෙයක්. බොහෝ මව්පියන් කරන්නේ දරුවා කුඩා නිසා කන්නාඩි පැළඳවිය නොහැකියි ඒ නිසා ලොකුවුණහම පලඳවනවා කියා එය අතපසු කරනවා. නමුත් එය දරුවාට කරන ලොකු හානියක්. දරුවකුගේ මොළය වර්ධනය අවසන් වූවාට පසු කණ්ණාඩි පැළඳවීමෙන් අවශ්‍ය ප්‍රතිඵල ලබාගැනීමට හැකියාවක් නැහැ. නිවැරදි පෙනීම සමග මොළයේ වර්ධනය නියාමාකාරයට සිදුවීමට ඉඩහැරීම මගින් හොඳ පෙනීමක් දරුවකුට ලබාගන්න හැකිවෙනවා. වයස අවුරුදු හය, හත දක්වා කාලයේදී ඇස්වල හටගන්නා වර්තන ආබාධ හඳුනාගෙන කන්නාඩියක් පැළඳවීම තුළින් බොහෝ දුරට ඇසේ පෙනීම ආරක්ෂා කරගන්න පුළුවන්.

දෘෂ්‍යාබාධ ඇති දරුවන් සිටින මාපියන් වැඩිදෙනෙක් අහන දේවල් තමා, කන්නාඩියක් දැමීමෙන් ඇසේ ආබාධ තත්ත්වය සම්පූර්ණයෙන් නැතිවෙයිද, ටික කාලයක් පලඳ ගැලෙව්වට කමක් නැද්ද කියන දේ. නමුත් අපි තේරුම් ගන්න ඕනේ දරුවකුට කන්නාඩියක් පලඳින්නේ ඇසේ ව්‍යුහයේ හෝ ඇස් බෝලයේ ප්‍රමාණයේ තිබෙන ප්‍රශ්නයක් නිසා කියලා. ඒ නිසා කන්නාඩියක් පළඳගැනීමෙන් ඇසේ ව්‍යුහයේ සිදුවී ඇති වෙනස්කම නිවැරදි කරන්න අමාරුයි. එමනිසා ගොඩාක් වෙලාවට කන්නාඩිය දිගටම පැළඳීමට අවශ්‍යවෙනවා. එය තීරණය වන්නේ ඇසේ කොපමණ ප්‍රමාණයකට වර්තන ආබාධ තත්ත්වය තිබෙනවාද යන්නත් සමගයි.

මයෝපියා කියන තත්ත්වය ඇතිවීම අඩුකරගන්න පුළුවන් ළමයින්ට වැඩිපුර එළිමහනේ ගතකරන්නට සැලැස්වීමෙන්. එළිමහනේ වැඩිපුර ගැවසෙන දරුවන් මෙම මයෝපියා තත්ත්වයට ගොදුරුවීම අඩු බව සමීක්ෂණ වාර්තාවලින් පෙන්වා තිබෙනවා. අඩුම තරමේ ළමයෙක් දවසකට පැය එකහමාරක් දෙකක්වත් එළිමහනේ ගතකිරීම තුළින් මයෝපියා කියන තත්ත්වය ඇතිවීම වළක්වා ගන්න පුළුවන්.

2008 වසරේදී කරනු ලැබූ සමීක්ෂණ වාර්තාවකින් පෙන්නුම්කර තියෙනවා ගම්බද සිටින දරුවන්ට වඩා නගරයේ සිටින දරුවන්ට මයෝපියාතාවය වැඩිවෙලා කියලා. එමෙන්ම දරුවන්ගේ ජංගම දුරකතන හා විද්‍යුත් තිර භාවිතය හැකිතාක් අවම කිරීම ද මෙම තත්ත්වය ඇතිවීම වැළැක්වීමට වැදගත් වෙනවා. අවුරුදු දෙක දක්වා දරුවන්ට විද්‍යුත් තිර භාවිතය කිසිසේත්ම අනුමත කරන්න බෑ.

පරිගණක හා ස්මාට් ජංගම දුරකතන මගින් පිටකරන කිරණවලින් ඇස්වල පිළිකා හටගැනීමක් සිදුකරනවද කියා ගොඩාක් දෙනෙක් අහනවා. නමුත් පරීක්ෂණවලින් කියන්නේ එහෙම දෙයක් සිදුවෙන්නේ නැහැ කියලා. පරිගණක හා ජංගම දුරකතනවලින් පිටකරන අහිතකර කිරණ එළියට යාම වැළැක්වීම සඳහා අවශ්‍ය ආවරණ ඒ උපකරණ ඇතුළෙම ගොඩනගා තියෙනවා. ඒ ආවරණ හරහා පොඩි කිරණ ප්‍රමාණයක් නිකුත්වුණත් එය පිළිකා සෑදීමට තරම් අවදානමක් නෑ.

සටහන හා ඡායාරූපය
**තඹුත්තේගම සමන් දිසානායක**

---

# ලූ. ලූ.. ලූ...

## තට්ටු පිටින් කඩා වැටුණු ගොඩනැගිලි හදපු මිනිහා ආයෙත් පුටුවට



රාජධානියකට සම්බන්ධ පැත්තකලු. දරන්නේ ලොකු තනතුරක්ලු. ගණන් හිලව් එක්කම වැඩලු. නමට ලොකු වුණාට කොරන්ට පුළුවන් දෙයක් නැතිලු. මෙතැනට ආවේ පන්දම් අල්ලලාලු. කාසි හොයන්න දක්ෂයාලු. ඒ සේරම හොයන්නේ චමින්ලු. ඉස්සර හිටියේ පළමු පුරවැසියෙක් ළඟලු.

උදේට පායන හවසට බහින, පෝයදට එළියදෙන එකක නමක් තියෙන තැනක් තියෙනවාලු. දේශීය දේ ප්‍රචලිත කොරන තැනක් හදන්න යෝජනා වුණාලු. තට්ටුම තුනයිලු. කාසිපනම් හිටපු පළමු පුරවැසියාගෙන්ලු. වැඩේ පටන් ගත්තාලු. දෙවැනි තට්ටුව ඇද වුණාලු. පළමු පුරවැසියා අධීක්ෂණේ කෙරුවාලු. ඇදේ ජයටම දැක්කාලු. ලොකු තැන ගෙන්නුවාලු. දෙහි කැපුවාලු. පැත්ත පළාතෙන්ම එළවලා දැම්මාලු. මේකා මගේ නමත් කැවා කිව්වාලු. හිටියේ තරහින්ලු. මනාප යුද්දේ ආවාලු.

ලොකු තැනට පාඩමක් උගන්නවා කිව්වාලු. හතුරු පැත්තට පැන්නාලු. එයා නම් තරුණ පහේ කෙනෙක්ලු. කඩේ ගියේ ප්‍රසිද්ධියේලු. මුලින් හිටපු තැනට එන්නම ඕනි කිව්වාලු. දැන් ඇවිල්ලාලු. පවර් එක මුලට වඩා වැඩියිලු. කොරන වැඩ නම් ඇදේටමලු. පුරවරයට වැඩ කොරන්න කාසි පොම්ප වෙනවාලු. කොටසක් මෙයාගේ සාක්කුවටලු. කල්ල මරේලු. යටතේ ඉන්න අයත් මෙයාට කැමතිම නැතිලු. කොහොම වුණත් බලේ ඊට වඩා වැඩියිලු. ඉන්න තැනින් පන්නන්න කොටසක් බලාගෙන ඉන්නවාලු.

## කුකුළු පැටව් හා පැළ වර්ග බෙදද්දි කූඨ ලේඛන හදලා



තනතුර ටිකක් ලොකුයිලු. ඉන්නේ පුරවරයකලු. ඉස්සර නම් පාන් කියාගන්නවත් බැරි කෙනෙක්ලු. දැන් නැති දෙයක් නැතිලු. සිතූ සිතූ සම්පත් පහළ වෙලාලු. යාන වාහන ගොඩයිලු. නිවහන මාලිගාවක් පරාදයිලු. මෙහෙම දේවල් ගත්තේ කොහොමද කියලා පුරවැසියට පුරස්නයක්ලු.

ඒවා ගත්තේ කොහොමද කියන එක ප්‍රසිද්ධ රහසක්ලු. මෙයා කරන්නේ අපූරු වැඩක්ලු. නැති බැරි එකාට උදව් කොරන්ට පුදුම උණක්ලු. ශරීරේ වඩවන දෙයක් දෙන සතුන් බෙදන්න දක්ෂයාලු. හොයන්නේම සමිති සමාගම්ලු. ඔක්සිජන් දෙන දේවල් හැමතැනම හදමු කියලත් යෝජනාව එයාගෙන්මලු. සත්තු දෙන්නේ 50ක්ලු. ඔක්සිජන් දෙන දේත් දෙන්නේ පනහක්ලු. හැබැයි පොතේ මාක් කොරන්නේ පන්සීයයිලු. ඉතිරි ටික හොර පාරෙන් කළු කඩේටලු. මල්ල පිරුණේ එහෙමලු. යාන වාහන ගත්තෙත් එහෙමලු.

මාලිගා හැදුවෙත් එහෙමලු. තුන් හතර පොලකින් ඉහළ තැනකට රපෝර්තු කෙරුවාලු. පරීක්ෂණ පිට පරීක්ෂණලු. පුරවැසියා ඇත්ත කියනවාලු. මෙයාගේ හොර වැඩ සේරම අහුවෙලාලු. මුට්ටි අල්ලන්න දක්ෂයෙක්ලු. පරීක්ෂණවලින් බේරෙන හැටි දන්නවා කිව්වාලු. බලවත් උදවිය ළඟ ගැවසෙනවාලු. වැඩ කොරන්නේ බලෙන්ලු. පරීක්ෂණ නවත්වන්න බලපෑම්ලු. ඒ අයත් අඩියක් පස්සට අරගෙනලු. හැමදම වුනේ මෙහෙම දේවල්ලු. හැම පාට් එකක්ම පොඩි එකාටලු.

## මන්ත්‍රීකම ආබරණයක් කරගෙන සමහරු ඩීසල් වෙළෙඳාමේ



පුරවැසියා විඳින්නේ දුකක්ලු. හැමතැනම එහෙමලු. සමහරු ගොඩයන්නේ බලා ඉද්දිලු. සමහරු වැටෙන්නේ පල්ලටමලු. මේවාට වගකියන්න කෙනෙක් නැතිලු. මේ දවස්වල අස්වනු නෙළනවාලු. රටට බත් දෙන උදවියට ඒක කොරගන්නත් බැරිලු. මැෂිමට යොදන ඒවා හිඟයිලු.

ඒ හින්දම පුරවැසියා ඉන්නේ පෝලිම්වලලු. පිටතැන්වල ගාණ සැරයිලු. ඒ ගැන ඇහැව්වම පුරවැසියට පේන්නේ තරුලු. දැන් අපූරු වැඩක් වෙනවාලු. වැඩේට බැහැලා ඉන්නේ ඉහළට ගොට්ට අල්ලන පහළ පිරිසක්ලු. තමන්ට හිතවත් හෙන්චයියන් කැඳවනවාලු. ගැළපෙන ඇඳුමක් අන්දනවාලු. පුරවගන්න කියලා හිස් ඒවා දෙනවාලු. යවන්නේ පෝලිමටලු. අපි කරන්නේ රටට බත් දෙන වැඩේ කියනවාලු.

පුරවා අරන් එන්නේ ලොකු ගණනක්ලු. ලොක්කට දුන්නම එයා වැඩි ගාණට විකුණනවාලු. ඒක කරන්නේ අශ්ව ගණනකටලු. හැම තැනින්ම තැලෙන්නේ පොඩි එකාලු. මේ ගැන රපෝර්තු කොරන්ට තැනක් නැතිලු. වගකිවයුතු තැන් නිහඬයිලු. ලැබෙන ගතමනාවෙන් කොටසක් ඉහළට යනවාලු. ආරක්ෂාව ලැබෙන්නේ ඒ හින්දමලු. හොරකම් කරන්නේ කතාවෙලාලු. පොඩි එකා ගැන හොයන්න කෙනෙක් නැතිලු. මේ උදවියට පොඩි එකා මතක් වෙන්නේ මනාප යුද්ධයක් එනකොටලු. එතකොට අලි කොටි දෙන්නම් කියනවාලු. පොඩි එකා ආයෙත් රැවටෙනවාලු. ඇති හැකි එකා බැරි එකා පාගලාම දුනවාලු.

**කිරලා**



# කොරෝනා දැන් හෙම්බිරිස්සාවක් වෙලා

# අවුරුදු 30-59 අතර අයගෙන් එන්නත් අරන් තියෙන්නේ 40% යි

## අනුරාධපුර දිස්ත්‍රික් වසංගත රෝග වෛද්‍ය රත්නායක



(රාජාංගණය - නුවන් කුමාර)

වර්තමානයේ සිටින රෝගීන් එතරම් සංකූලතා නොදක්වන බැවින් කොරෝනා රෝගීන් හඳුනාගැනීමේ පරීක්ෂණ සිදුවන්නේ ඉතාමත් අඩුවෙන් බව අනුරාධපුර දිස්ත්‍රික් වසංගත රෝග වෛද්‍ය බී.එස්.එම්.ආර්. රත්නායක මහතා කියයි.

කොවිඩ් 19 හෙවත් කොරෝනා වසංගතයේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ තත්ත්වය පිළිබඳව අප කළ විමසීමේ දී අදහස් දක්වමින් ඒ මහතා මේ බව පැවසීය.

දැන් කොරෝනා රෝගීන් මිය යෑම ඉතාමත් අඩු මට්ටමකට ඇවිල්ලා. ඒ නිසා හඹාගෙන ගිහින් රෝගීන් හඳුනා ගැනීමේ අවශ්‍යතාවක් නැහැ. ඒ වගේම නිරෝධායනය කිරීමක් අවශ්‍ය වෙන්නෙත් නැහැ. කොරෝනා දැන් සාමාන්‍ය හෙම්බිරිස්සාවක් කැස්සක් වගේ රෝගයක් බවට පත්වෙලා. ඉස්සර වගේ හඳුනාගන්නා රෝගීන්ටත් සංකූලතා විශාල ලෙස ඇතිවෙන්නේ නැහැ. ජනතාව කළ යුත්තේ තමන්ම පරිසම් වෙලා රෝගයෙන් වැළකෙන එකයි. රට වහලා තියන්න බැහැ. සමාන්‍ය තත්වයෙන් ඉදිරියට යායුතුයි. ඒ සඳහා ජනතා සහය ඉතාමත් අත්‍යවශ්‍යයි.

මේ විදිහට සංකූලතා අඩුවෙන්න බලපෑ ප්‍රධාන හේතුව විදිහට මම දකින්නේ එන්නත් කරණයෙන් ලැබුණු ප්‍රතිශක්තිකරණයයි. පී.සී.ආර්. පරීක්ෂණ කට්ටල තිබුණත් රැපිඩ් ඇන්ටිජන් පරීක්ෂණ කට්ටලවල දැඩි හිඟයක් තියෙනවා. අවශ්‍යම වුණොත් පරීක්ෂණ කරනවා. ඒ අනුව කරපු පරීක්ෂණවලින් රෝගීන් 150ක් විතර පසුගිය සතියේ හමුවෙනවා. ඉස්සර මිය ගිය අයට කොරෝනා තියෙනවද කියලා බලන්න පරීක්ෂණ කළත් දැන් ඒවා සිදුවෙන්නේ අඩුවෙන්. ඒ වගේම මිය ගිය පුද්ගලයා කොරෝනා රෝගයට ගොදුරුවෙලා හිටිය කෙනෙක් වුණත් ගෙදර අනික් අයගේ පරීක්ෂණ කිරීමේ අවශ්‍යතාවක් නැහැ.

දිස්ත්‍රික්කයක් විදිහට ගත්තාම තුන්වැනි එන්නත් මාත්‍රාව ලබාගැනීමේ ප්‍රගතිය 60% සිට 65% සීමාවේ ඉන්නවා. එන්නත් ගත්ත අවුරුදු 60 වැඩි පිරිස 90%ක් විතර ඉන්නවා. කොහොම වුණත් අවුරුදු 30 සිට 59 වයස් බාණ්ඩයේ අය එන්නත් ලබාගැනීම 40%ක් විතර වෙනවා. **අවුරුදු 20 සිට 29 බාණ්ඩයේ 25%ක් විතර තමයි අරගෙන තියෙන්නේ.** පාසල් දරුවන් එන්නත් ලබාගැනීම ඉතාමත් ඉහළ මට්ටමක පවතිනවා. අපේ අරමුණ තමයි තුන්වැනි මාත්‍රාව ලබාගැනීමේ ප්‍රගතිය 75% දක්වා වැඩිකර ගැනීම යැයි ද රත්නායක මහතා වැඩිදුරටත් කියා සිටියේය.

# හිටපු සෑම ප්‍රධාන ලේකම්වරයෙක්ම නිල රථ දෙක බැගින් භාවිත කළා



## ප්‍රවාහන දීමනාව ගනිමින් රජයේ වාහන පාවිච්චි කරන නිලධාරීන්ට මගෙන් කිසිම සමාවක් නෑ

### ප්‍රධාන ලේකම් චන්ද්‍රසිරි බණ්ඩාර කියයි

(අනුරාධපුර අධිකරණ උපාලි ආනන්ද)

තමා සහ රාජ්‍ය පරිපාලන අමාත්‍යංශයේ ලේකම්වරයා විසින් නිකුත් කර ඇති චක්‍රලේඛ උල්ලංඝනය කරමින් උතුරු මැද පළාත් සභාවේ යම් නිලධාරියකු රජයේ වාහන සහ ඉන්ධන නීතියට පටහැනි ආකාරයෙන් භාවිතා කරන්නේ නම් ඔවුනට එරෙහිව දැඩි ක්‍රියාමාර්ග ගන්නා බවට උතුරු මැද පළාත් සභාවේ ප්‍රධාන ලේකම් චන්ද්‍රසිරි බණ්ඩාර මහතා සහතික වෙයි.

ප්‍රධාන ලේකම්වරයා මේ බව සඳහන් කළේ උතුරු මැද පළාත් සභාවේ ඇතැම් රාජ්‍ය ආයතනවල ඇතැම් ඉහළ නිලධාරීන් ප්‍රවාහන දීමනාවද ලබා ගනිමින් රජයේ වාහනද නීති විරෝධීව පරිහරණය කරන බවට ඉරිද ලංකාදීප රජරටට ලැබී ඇති තොරතුරු සම්බන්ධයෙන් දුරකථනයෙන් කළ විමසුමකට ප්‍රතිචාර දක්වමිනි.

මේ පිළිබඳව තවදුරටත් අදහස් දක්වමින් උතුර මැද පළාත් ප්‍රධාන ලේකම් චන්ද්‍රසිරි බණ්ඩාර මහතා මෙසේද කීවේය.

ප්‍රවාහන දීමනාවද ලබා ගනිමින් රජයේ වාහනද භාවිතා කරන බව කියන ඉරිද ලංකාදීප රජරට පෙන්වා දුන් නිලධාරියා සම්බන්ධයෙන් මෙන්ම එවැනි තවත් වෙනත් නිලධාරීන් සිටී නම් ඔවුන් සම්බන්ධයෙන් මා පෞද්ගලිකවම දැඩි අවධානයෙන් සිටිමින් සොයා බලා කටයුතු කරනවා. අදාළ නිලධාරියා හෝ වෙනත් නිලධාරියෙකු එලෙස රජයේ චක්‍ර ලේඛ උල්ලංඝනය කරමින් රජයේ වාහන භාවිතා කරන්නේ නම් ඔවුන් සම්බන්ධයෙන් දැඩි ක්‍රියාමාර්ග ගැනීමටද මා පසුබටවන්නේ නැහැ. ඔවුන් ආරක්ෂා කරන්න මට කිසිදු වුවමනාවක්ද නැහැ.

උතුරු මැද පළාත් සභාවේ සංචිත වාහනවලට ඉන්ධන අවම වශයෙන් භාවිතා කරන ලෙසත් හැකි සෑම අවස්ථාවකම රාජකාරි සඳහා කණ්ඩායම් වශයෙන් යනවා මිස පෞද්ගලිකව නොයන ලෙසත් පළාතේ රෝහල්, වැඩිහිටි නිවාස සහ ළමා නිවාස හැර සෙසු සියලු රාජ්‍ය ආයතනවල ආරක්ෂක සියලු විදුලි බුබුළු සවස 6 න් පසුව නිවා දමන ලෙසටත් මා චක්‍රලේඛයක් මගින් සියලු ආයතනවලට දන්වා තිබෙනවා.

මීට පෙර හිටපු සියලුම ප්‍රධාන ලේකම්වරුන් නිල රථ දෙක බැගින් පරිහරණය කර ඇති බවද අවධාරණය කළ පළාත් ප්‍රධාන ලේකම්වරයා තමා පමණක් එම වාහන දෙකෙන් එක් වාහනයක් ඉවත් කර දැනට භාවිතයට යොදගෙන ඇත්තේ එක් නිල රථයක් පමණක් බවද ඔහු කීවේය.

තමා කිසිදු ගමන් වියදමක් හෝ සංග්‍රහ දීමනාවක් ලබා නොගන්නා බවද කියා සිටි හෙතෙම බීමට වතුර පවා තමා රැගෙන එන්නේ නිවසින් බවත් අවම වශයෙන් රජයේ මුදලින් තමා පත්තරයක්වත් ලබා නොගන්නා බවත් පත්තර පවා මිලදී ගන්නේ පුද්ගලික මුදලින් බවත් කීවේය.

පළාතේ සෙසු රාජ්‍ය නිලධාරීන්ගෙන්ද තමා එවැනි විනය ගත වීමක් අපේක්ෂා කරන බවද පවසන පළාත් ප්‍රධාන ලේකම් චන්ද්‍රසිරි බණ්ඩාර මහතා පසුගිය කාලයට හා සාපේක්ෂව පළාතේ රාජ්‍ය නිලධාරීන් තුළ එම විනය ගත වීම යම් මට්ටමකින් ඉහළට පැමිණ ඇති බවද කීවේය. රටේ පවතින දැඩි ආර්ථික සහ බලශක්ති අර්බුදය හමුවේ උතුරු මැද පළාත් සභාවේ වියදම් සියයට 30 ක් ඉතිරි කර ගැනීම තම ඉලක්කය බවද කියා සිටි හෙතෙම එසේ කළ යුතු බවට තමා පළාතේ ආයතන ප්‍රධානීන්ට ස්වකීය චක්‍ර ලේඛයක් මගින් ද දන්වා ඇති බවද තවදුරටත් පැවසීය.

# හබරණදී වල් අලියකුට කැබ් රියකින් වෙට්ටු දැමූ රියැදුරුට ලක්ෂ 2 ක් දඩ

(අනුරාධපුර අධිකරණ උපාලි ආනන්ද)

ත්‍රිකුණාමලය - හබරණ ප්‍රධාන මාර්ගයේ සැරිසරමින් සිටි වල් අලියකු පසුපස කැබ් රථයකින් ලුහුබැඳිමින් ඒ අලියාට හිංසා කිරීමට යම් උපක්‍රමයක් භාවිතා කළ බවට අධිකරණය හමුවේ චෝදනා ලබා සිටි කැබ් රථ රියැදුරකු එකී චෝදනාවට වරද පිළිගත් පසුව කැකිරාව දිසා විනිසුරු සහ මහේස්ත්‍රාත් සමන් වැරණියගොඩ මහතා ඔහුට මුදලින් රුපියල් ලක්ෂ දෙකක දඩයක් නියම කළේය.

මෙසේ දඩ නියම වූයේ කැකිරාව ඩිපෝ හන්දිය තරුණ සේවා සභාව අසල ලිපිනයේ ආර්.එම්. ගිම්හාන් ධනංජය රාජසිංහ නමැති 22 හැවිරිදි කැබ් රථ රියදුරකුට ය.

හබරණ - ත්‍රිකුණාමලය ප්‍රධාන මාර්ගයේ රාත්‍රී කාලයේ සැරිසරමින් සිටි වල් අලියකු පසුපස මෙම සැකකරු කැබ් රථයකින් ලුහුබැඳිමින් ඒ අලියාට හිංසා කිරීමට යම් උපක්‍රමයක් භාවිතා කරන අයුරු සමාජ මාධ්‍ය මාධ්‍ය ඔස්සේ ප්‍රසිද්ධියට පත් කිරීමත් සමග විමර්ශන මෙහෙයවා වනජීවී නිලධාරීන් විසින් ඔහු මෙලෙස අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කෙරිණි.

මින්නේරිය ජාතික වනෝද්‍යානයේ උද්‍යාන භාරකරු ප්‍රදීප් මහතාගේ උපදෙස් මත වන සත්ව අඩවි ආරක්ෂක වාසල මහතා සැකකරු අධිකරණයට ඉදිරිපත් කරමින් කරුණු කීවේය. ත්‍රිකුණාමලය හබරණ ප්‍රධාන මාර්ගයේ සැරිසරන වන සතුන්ට හිංසා කිරීම දඬුවම් ලැබිය හැකි වරදක් බව ගැසට් නිවේදනයක් මගින් ප්‍රකාශයට පත් කර කොට තිබේ.

# ඉඩමේ අයිතිය වෙනුවෙන් හත්වරක් හිරේ ගිය මාලි



අතීතයෙන් සිද්ධියක්-28

අසාධාරණ ලෙස ඉඩමක් අල්ලාගත් පිරිසකට එරෙහිව සටන්කර හත් වතාවක් හිරේ ගිය අභීත කාන්තාවක් ගැන කහටගස්දිගිලිය ප්‍රදේශයෙන් වාර්තාවේ. 1920 දී පමණ සිදුවන එම සිද්ධිය පිළිබව තොරතුරු දක්වන්නේ ඇගේ මුණුබුරකු වන කුකුලෑව ගමේ පදිංචි ඩබ්ලිව්. විමලසිරි මහතායි.

වසර දෙසීයකට පෙර මාලී නමින් ප්‍රාදේශීය නායිකාවක් මේ ප්‍රදේශයේ ජනයාට නායකත්වය දෙයි. ඇය ජනප්‍රවාදයේ වීර කාන්තාවක් වන නිසා ඊට සියවසකට පසු බිහිවන තවත් දක්ෂ කාන්තාවකට ද මාලී යන නම ආරෝපණය කරයි. ඇය ද රූපයෙන් අති සුන්දර වන අතර අසාධාරණයට එරෙහිව සටන් කරන්නියක වෙයි.

වරක් ඇයට උරුම කුකුලෑව ගමේ ඇති ඉඩමක් යාබද මැකිච්චාව ගමේ සිටින විශ්වාසවන්ත පුද්ගලයකුට උකස් කිරීමට සිදු වෙයි. උකස්කරයක් ලියා මුදල් ලබාගන්නා ඇය කෙටි කලකින් ආපසු මුදල් ගෙවා උකස බේරා ගනියි. එහෙත් උකස ලියූ ලිපිය ඇයට ආපසු නොලැබෙයි. එය ඉරා දැමීමට හෝ ආපසු ගැනීමට අවශ්‍ය නැති බව ඇය පවසයි. හේතුව දෙපාර්ශවයේ ඇති විශ්වාසයයි. අවිශ්වාසයක් පැවැතියත් මාලිට ඇති බිය නිසා කිසිවෙක් ඇගේ කුඹුරට නොබසින බව මාලි විශ්වාස කරයි.

ඉඩම උකස් ගෙන සිටි පුද්ගලයා කලක දී මිය යයි. උකස්කර ලිපිය ඔහුගේ පුතකුගේ අතට පත්වෙයි. මීට පෙර සිදුවූ ගනුදෙනුව මායිම් නොකරන ඒ පුතා උගස අරවාගන්නා ලෙස මාලිට පවසයි. මාලි එය කිසිසේත් ගණන් නොගනියි. දෙවරක් ආපසු මුදල් ගෙවන්නට අවශ්‍ය නොවන බවත් තමන් වංචා නොකරන බවත් ඇය කියා සිටියි. එවිට මැකිච්චාවේ පුද්ගලයාගේ පුත්‍රයා කරන්නේ උකස් ලියුම කුකුලෑව ගමේ විදානේට ලබා දෙමින් ඔහුගෙන් මුදල් ලබා ගැනීම ය. විදානේ කුකුලෑවේ පුද්ගලයා විශ්වාස කර ඉඩම මිල දී ගනියි.

මෙම සිද්ධිය මාලිට ආරංචි වෙයි. කඩදසිය අතට ගත්තාට ඉඩමට නොබහින්නැයි මාලි විදානේට අනතුරු අඟවයි. විදානේ ඇයගේ ඥාති සොයුරෙකි. විදානේ මාලිට ඇති බිය නිසා චණ්ඩීන් 20ක් සමග කුඹුරට බැස වී වපුරන්නටත්, වැට හදන්නටත් සැරසෙයි. ඊට කිපී පැමිණෙන මාලී චණ්ඩීන් දහත් දෙනෙක්ටම එළව එළවා පහර දෙයි. චණ්ඩියෝ අතැති අවි ආයුධ ද බිම හෙළා දුවති.

සහෝදරයෙක් හා සහෝදරියක් අතර සටන නිසා එය නැවැත්වීමට කිසිවෙකුටත් නොහැකිවෙයි. විදානේට පක්ෂපාතී පාර්ශවය නැවත එක්ව වටවී මාලීව අල්ලා ගනිති. මාලී මෙල්ලකරගෙන පොලීසිය දක්වා ගෙනයාම ලෙහෙසි පහසු නොවන නිසා අඟ ලණුවක් ගෙන ඇගේ දෑත් වෙළීමට පිරිස කටයුතු කරති. නිලධාරී හා පොලිසිය ද ඊට මැදිහත් වෙති. මාලි උසාවිය දක්වාම රැගෙන යන්නේ දෑත ගැට ගැසීමෙනි. ඒ ගමනේ දී ඔවුන්ට අවනත බව අඟවන මාලී උසාවියේ විත්ති කූඩුවට නගින තුරුම නිහඬව සිටියි. පැමිණිලි පාර්ශවය හා නීතිඥයා නඩුකාරයට කරුණු දක්වයි. නඩුකාරයා ඇය දෙස හැරී බලනවාත් සමඟ මාලි අඟලණුවෙන් බඳින ලද අත් දෙක ඔසවා වචන එළියට දමයි.' ස්වාමිනී, මේ බලන්න මේ ගැහැනියකට දෙන දඬුවමක් ද? මේච්චර පිරිමි සමූහයක් එකතු වෙලා තනි මට වද හිංසා කළා කියමින් මාලි උසාවියේ ගෝරනාඩු කරයි. ඇගේ දෑත හා ප්‍රකාශය නිසා නඩුකාරයා ද තිගැස්සෙයි. ඔහුගේ මුහුණ වද මලක් මෙන් රතු වී යනු බලා සිටින පිරිස ද බියට පත් වෙති. එහෙත් ඔවුහු ඇය මෙල්ල කර ගැනීමට වෙනත් ක්‍රමයක් නොවන බවට හේතු දක්වති.

ගමේ විදානේ ඊට වගඋත්තර බඳිමින් 'ස්වාමිනී තනි ගැහැනියක් වුණත් මිනිසුන් 17 දෙනකුට කැත්තෙන් කෙටුවා. මෙල්ලකර ගන්නයි මෙහෙම කළේ කියමින් සිය ලියකියවිලි උසාවියට ඉදිරිපත් කරයි. අවසානයේ මාලි රිමාන්ඩ් කරන ලෙස නියෝග ලැබෙයි.

බන්ධනාගාරයට යන මාලිට එහි සිටින හැමෝම බිය වෙති. නියමිත දින ගණන අවසන්ව උසාවියට යාමට පිටත් වන මාලී 'මම අද නිදහස් වුණත් මගේ පිඟාන කවුරුවත් ගන්න එපා. ආයෙත් මං එනවා. මේක මෙතනින් එල්ලලා තියාපල්ලා යැයි කුටියේ සිටින අනෙක් අයට කියා පිටත් වෙයි. ඇප ලබන මාලි ගමට ගොස් ඉඩම අල්ලාගනී. එයට විරුද්ධවීමට එන අයට නැවත පහර දෙයි. නැවතත් ඇය නඩුවට කැඳවනු ලබයි. ඇය වරදකාරිය වෙයි. බන්ධනාගාරයේ පෙර සිටි ස්ථානයටම යන මාලි එහි සිකරුවන් අතර සිය අණසක පතුරුවා ගනියි. නැවත නිදහස්වන ඇය තුන්වැනි වතාවටත් විරුද්ධවාදීන්ට පහර දෙයි. ඒ ආදී වශයෙන් මාලි හත් වතාවක්ම සිරගත වන තුරු සිය සටන කරගෙන යයි. ඒ වනවිට මාලි බඩ දරු මවකි. ඇයම පසුව සටන අත්හරියි.

අනුරාධපුර
සරත් මනුල වික්‍රම

## ශ්‍රී මහා බෝධිය සහ අටමස්ථානය අවට

# යාචකයන්ට කසිප්පු විකුණූ දෙදෙනකුට තිස් දහසක් දඩ

(අනුරාධපුර අධිකරණ උපාලි ආනන්ද)

අනුරාධපුර ශ්‍රී මහා බෝධිය සහ අටමස්ථානය අවට සිටින යාචකයින්ට නීති විරෝධී මත්පැන් (කසිප්පු) අලෙවි කරමින් සිටියදී කාලේ කසිප්පු බෝතල් 30කද සමඟ අත්අඩංගුවට ගෙන අධිකරණය හමුවට ඉදිරිපත් කළ සැකකරුවන් දෙදෙනකු එකී චෝදනාවට වරද පිළිගත් පසුව අනුරාධපුර ප්‍රධාන මහේස්ත්‍රාත් සහ අතිරේක දිසා විනිසුරු නාලක ජයසූරිය මහතා ඔවුනට රුපියල් තිස් දහසක දඩයක් නියම කළේය.

එක් සැකකරුවකුට මුදලින් රුපියල් පහළොස් දහස බැගින් මෙම තිස් දහසක දඩ මුදල නියම කෙරිණි. මෙසේ දඩ නියම වූයේ අනුරාධපුර රාම කැළේ ආර්. සුනිල් සෝමපාලට සහ අනුරාධපුර ශ්‍රී මහා බෝධි මාවත ස්ටැන්ලි බාලා නමැත්තෙකුටය. මෙම පුද්ගලයන් දෙදෙනා කාලේ වීදුරු බෝතල්වලට නීති විරෝධී මත්පැන් (කසිප්පු) පුරවාගෙන දිනපතා අලුයම 5ත් 6ත් අතර මෙලෙස අනුරාධපුර ජය ශ්‍රී මහා බෝධිය සහ අටමස්ථානය අවට සිටින යාචකයන්ට අලෙවි කරන බවට අනුරාධපුර මූලස්ථාන ප්‍රධාන පොලිස් පරීක්ෂක ලක්මාල් විජේරත්න මහතාට ලද බුද්ධි තොරතුරකට අනුව වැටලීම සිදු කර තිබේ. සැකකරුවන් කලක් තිස්සේ මෙම ජාවාරම කරගෙන ගොස් ඇති බව මූලික පොලිස් විමර්ශනවලදී අනාවරණය කර ගෙන තිබේ.

අනුරාධපුර කොට්ඨාස බාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී ජයන්ත පුෂ්ප කුමාර මහතාගේ අධීක්ෂණය යටතේ අනුරාධපුර මූලස්ථාන ප්‍රධාන පොලිස් පරීක්ෂක ලක්මාල් විජේරත්න මහතාගේ මෙයෙවීම මත දූෂණ මර්දන අංශයේ උපපොලිස් පරීක්ෂක රාජපක්ෂ මහතා ඇතුළු නිලධාරීහු පිරිසක් මෙම වැටලීම කළහ.

# දිඹුලාගල ප්‍රා: ලේ. කාර්යාලයේ නිලධාරීන්ගේ සෞඛ්‍ය පිරික්සයි



**දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සේවයේ නියතු සියලුම රාජ්‍ය නිලධාරීන්ගේ සෞඛ්‍ය තත්වය පරීක්ෂා කිරීමේ වෛද්‍ය සායනයක් ඉකුත් 31 ද දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාල පරිශ්‍රයේ දී දවස පුරා පැවැත්විණි.**

වකුගඩු ආසාදන, දියවැඩියාව හා අධික රුධිර පීඩනය වැනි බෝනොවන රෝග හඳුනා ගැනීම මෙහිදී සිදු කෙරුණු අතර ඒ රෝග තත්වයන් ඇති නිලධාරීන් ප්‍රතිකාර සඳහා අදළ සායන වෙත ඉදිරියේ දී යොමු කිරීමට කටයුතු කරන බව ද එහි නිලධාරියෙක් පැවසීය.

දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් පී.ටී.එම්. ඉර්ෆාන් මහතාගේ ඉල්ලීම පරිදි මනම්පිටිය රෝහල මගින් මෙම සායනය සංවිධානය කර තිබිණි. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරීහු සියයකට අධික පිරිසක් මෙම සායනයට ඉදිරිපත් වූ බව වෛද්‍යවරයෙක් පැවසීය.

(නුවරගල විපුල සිරිවර්ධන)

# අනුරපුර මැදි විදුහලේ විදුහල්පති පුටුවටත් හිස් පුස් මිනිහෙක්?

## අමන දේශපාලකයකුගෙන් ප්‍රබල මෙහෙයුමක්

### නව නිදහස් ගුරු සංගමයේ අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් රෝහිත කියයි

(රාජාංගණය - නුවන් කුමාර)



රෝහිත දිසානායක

ප්‍රදේශයේ දේශපාලන බලවතකුගේ වුවමනාවට අනුරාධපුර මධ්‍යම මහා විදුහලට සුදුසුකම් නැති විදුහල්පතිවරයකු පත්කිරීමේ සූදානමක් පවතින බව නව නිදහස් ගුරු සංගමයේ අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් රෝහිත දිසානායක මහතා කියයි.

**ඉරිද ලංකාදීප රජරටට අදහස් දක්වමින් මේ බව කී දිසානායක මහතා මෙසේ ද පැවසීය.**

අනුරාධපුර දිස්ත්‍රික්කයේ ඉතාමත් අක්‍රමවත් අයුරින් විදුහල්පතිවරු පත්කරනවා. තමන්ගේ දේශපාලන කටයුතුවලට කඩේ ගිය හෙන්චයියන් තමයි මේ විදිහට පත්කරන්නේ. ඒක අනුරාධපුර දිස්ත්‍රික්කයේ අධ්‍යාපනයට තර්ජනයක්. අධ්‍යාපනය මේ තරම් පහළට වැටිලා තියෙන්නේ ඉතිහාසයේ හා වර්තමාන දේශපාලකයන් මේ විදිහට වැඩ කරපු හින්දයි. දැන් අනුරාධපුර මධ්‍යම මහා විදුහලේ විදුහල්පති තනතුර හිස්වෙලා. ඒකට පත්විය යුත්තේ අධ්‍යාපන පරිපාලන සේවයේ පළමු ශ්‍රේණියේ නිලධාරියෙක්. එහෙම නිලධාරීන් අනුරාධපුරයේ අඩුයි. හැබැයි එහෙනම් කළයුත්තේ අධ්‍යාපන පරිපාලන සේවයේ දෙවැනි ශ්‍රේණියේ නිලධාරියකු හෝ තුන්වැනි ශ්‍රේණියේ නිලධාරියකු පත්කිරීමයි. එහෙම නිලධාරීන් සම්මුඛ පරීක්ෂණයට සහභාගි වුණා.

ඒ අය කපලා දලා විදුහල්පති සේවයේ කෙනෙක් පත්කරන්න තමයි මේ අයගේ සූදානම. ඒ පත්කරන්න යන කෙනා පළාතේ ප්‍රබල දේශපාලකයකුට කඩේ ගිය කෙනෙක්. අනුරාධපුර මධ්‍යම මහා විදුහල කියන්නේ දිස්ත්‍රික්ක කිහිපයක දක්ෂම දරුවන් එකතුවෙලා ඉන්න තැනක්. පුත්තලම, කුරුණෑගල, වව්නියාව, පොළොන්නරුව වගේ දිස්ත්‍රික්කවලින් ශිෂ්‍යත්ව විභාගයෙන්, අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයෙන් ඉතා උසස් අන්දමින් සමත්වෙලා ආපු දරුවන් තමයි මේ විදුහලේ ඉන්නේ. ඒ වගේම විෂය බාහිර ක්‍රියාකාරකම්වලට දක්ෂ දරුවන් වැඩි පිරිසක් ඉන්නෙත් මේ විදුහලේ. ඉතිහාසයේ කවදවත් මේ විදුහලට මේ විදිහට විදුහල්පතිවරුන් පත්කරලා නැහැ. ඉහළම ඉන්න අධ්‍යාපන පරිපාලන නිලධාරීන් දේශපාලකයන්ගේ මේ වගේ අමන තීරණවලට විරුද්ධ වෙන්නේ නැහැ. දේශපාලකයන්ගේ පදයට එයාලා නටන්නේ සමහරුන්ගේ තියෙන කුණු කන්දල් වහගන්නයි, තමන්ගේ තනතුරේ වැජඹෙන්නයි විතරයි. පළාතේ දරුවන්ට මොනවා වුණත්, අධ්‍යාපනයෙන් ඉන්න තැනින් පහළට වැටුණත් ඉහළ අධ්‍යාපන පරිපාලකයන්ටවත්, දේශපාලකයන්ටවත් වගේ වගක් නැහැයි ද හෙතෙම අවධාරණය කළේය.

# බ්‍රාහ්මණයාගම වැව් ඉස්මත්තේ මී පැළ 250 ක් හිටවයි



74 වැනි නිදහස් දිනයට සමගාමීව රුක්රෝපණ වැඩසටහනක් මහවැලි එච්. කලාපයේ සියලුම ඒකක කළමනාකාර කොට්ඨාස ආවරණය වන පරිදි පැවැත්විණි.

ඊට සමගාමීව තඹුත්තේගම ඒකක කළමනාකරණ කොට්ඨාසයේ රුක්රෝපණ වැඩසටහන බ්‍රාහ්මණයාගම වැව් ඉස්මත්තේ දී පැවැත්විණි.

මී පැළ 250ක් රෝපණය කළ අතර ඒ වැඩසටහන තඹුත්තේගම ඒකක කළමනාකාර කුමාර ජයතිලක මහතා විසින් සංවිධානය කර තිබිණි.

බ්‍රාහ්මණයාගම ධීවර සමිතියේ හා ගොවි සංවිධානවල සාමාජිකයන්ගේ ශ්‍රම දයකත්වය ද මේ සඳහා හිමිවිය.

මෙම වැඩසටහන සඳහා මහවැලි එච්. කලාපයේ නේවාසික ව්‍යාපාර කළමනාකාර සුගත් වීරසිංහ, කොට්ඨාස කළමනාකාර නිල්මිණී ශ්‍රියාලතා ඒකක කළමනාකාර කුමාර ජයතිලක, රාජාංගණය ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුරංග මහේෂ් යන මහත්ම මහත්මීන් ඇතුළු විශාල පිරිසක් එක්වූහ.

(රාජාංගණය - නුවන් කුමාර)

# කෘෂිකර්මාන්තය වැනසීම කැත වැඩක්



පුරන්වන කුඹුරු යායක්

## ඉපලෝගම ගොවි හඬ



අජිත් වික්‍රමසිංහ



නලින් ප්‍රසන්න දයානන්ද



ප්‍රසන්න රාජකරුණා



කේ.පී. සුනිල්



ඩී.එම්. ආරියදස

### අමාරුවේ වැටුණේ රසායනික තෙල් පොහොර තහනමෙන්

### ගොයම අඩියක් වත් උස නෑ එක ගහක වී ඇට තුනක්වත් නෑ

### පේර, දෙළුම්, ගස්ලබු, කෙසෙල් වගා සියල්ල සහමුලින් විනාශයි

### කාබනික පොහොර කියලා දුන්නේ පස් ගොඩවල්

### අවුරුද්දක් තියා මාසයක්වත් කන්න මෙදා වී ඇටයක්වත් නෑ

### මීට පෙර සිටි කිසිම නායකයෙක් ගොවිතැන විනාශ කළේ නෑ

**ඉපලෝගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මානෑව සහ ගොඩයාය යන ගම්මාන දෙක වී, බඩඉරිඟු, එළවළු පලතුරු ඇතුළු ආහාර බෝග නිපදවන අනුරාධපුර දිස්ත්‍රික්කයට අයත් ප්‍රධාන පෙළේ ගම්මාන දෙකක් ලෙස සැලකේ. විශේෂයෙන්ම ලංකාවේ වැඩිම පේර නිෂ්පාදනයක් කරන ප්‍රදේශයක් ලෙස ඉපලෝගම සැලකෙන අතර මෙයට විශාල දායකත්වයක් ගොඩයාය ගම්මානයෙන් එකතු කරනු ලබයි.**

මානෑව මහවැව යටතේ වී වගාවත්, අහස් වැස්ස යටතේ බඩඉරිඟු, උඳු, මුං, කවුපි, තල ඇතුළු ආහාර බෝග වගාවත් ජල සම්පාදනය යටතේ පේර, දෙළුම්, කෙසෙල්, ගස්ලබු ඇතුළු ආහාර බෝග වගාවත් මෙම ගම්මාන ආශ්‍රිතව සිදු කරනු ලබයි. දශක ගණනාවක් පුරා ශ්‍රී ලාංකික කෘෂි ආර්ථිකයට සැලකිය යුතු දයකත්වයක් එකතු කරමින් සිටින මෙම ගම්මානවල ජනතාවගේ වගා සියල්ලම මේ වෙන විට අසාර්ථක වීම තුළින් ඔවුන්ගේ ආර්ථිකයට දැඩි පහරක් එල්ල වී ඇතැයි ගම්මුන්ගේ අදහසයි.

තලාව, කැකිරාව ප්‍රධාන මාර්ගයේ තලාව, කැකිරාව නගර දෙක අතර මැද දී හමුවන ඉපලෝගම හන්දියෙන් හැරී කිලෝ මීටර් දෙකක් පමණ මග ගෙවූ පසු යාබදව පිහිටි මානෑව සහ ගොඩයාය යන ගම්මාන දෙක හමුවේ. යාපනය, මහනුවර ඒ 9 ප්‍රධාන මාර්ගයේ මරදන්කඩවල සහ කැකිරාව නගර දෙක අතර පිහිටි වලගම්බාහුව හන්දියෙන් හැරී කිලෝ මීටර් හතරක් මග ගෙවූ පසු ද මෙම ගම්මාන දෙකට ප්‍රවේශ වීමට හැකියාව පවතියි.

දශක ගණනාවක් පුරා මහ පොළොව සමඟ ගැටී රටේ ජනතාවගේ ආහාර අවශ්‍යතාවය සපුරාලමින් තම පවුල්වල ආර්ථික මට්ටම ඉහළ නංවන්නට දහඩිය වගුරන මෙම ගම්මානවල ජනතාවගේ ගොවිබිම අද වන විට විනාශය කරා ළං වෙමින් තිබෙන අයුරු ඔවුන් සොයා ගිය ඉරිදා ලංකාදීප රජරට අපට දැකගන්නට ලැබුණි. එහිදී අප හා එක් වූ ගොවි මහතුන් කිහිප දෙනෙකුම ඔවුන්ට අත්ව ඇති ඉරණම අප හමුවේ පෙළගැසුවේ මෙලෙසිනි.

**මානෑව ගම්වාසී ඩී.එම්. ආරියදස මහතා:**

මානෑව මහවැව යටතේ වගා කරන කුඹුරු ඉඩම් වලින් මේ වතාවේ වගා කළේ හරි අඩක් විතරයි. මම මේ කන්නයේ අක්කර එකහමාරක් විතර වී වගා කළා. වෙනදා මේ කොටසින් වී බුසල් 150 ක් විතර ගන්නවා. මේ වතාවේ වී වැපුරුවාට කුඹුරේ වල් මර්දනය කර ගන්න විදිහක් නැති වුණා. පොහොර ටිකක් ගහගන්න වුණේ නෑ. දැන් ගොයම පූදිනවා. ගොයම අඩියක්වත් උස නෑ. එක ගහක වී ඇට දෙක තුනක් වත් නෑ. සමහර ගොයම් ගස් පීදෙන්නෙත් නෑ. මාතර උපන් මම මේ ගමෙන් කසාදයක් කරගෙන තමයි මේ ගමට ආවේ. අපේ තාත්තා මාතර තලල්ලේ. අම්මා වලස්ගම, නාකුලුගම අගමැති මහින්ද මහත්තයා, ජනාධිපති ගෝඨාභය මහත්තයා අපේ අම්මගෙ ඥාතීන් වෙනවා. මේ අය පහුගිය කාලයේ රටේ කරපු දේවල් හින්ද අපිට ලොකු ගෞරවයක් තිබ්බා. නමුත් මේ රටේ කිසිම නායකයෙක් කරපු නැති කැත වැඩක් නිසා රටේ මුළු කෘෂිකර්මාන්තයම විනාශ වුණා. මේ වතාවේ මං වගා කරපු අක්කර එක හමාරක කුඹුරෙන් වී බුසල් දහයක්වත් ගන්න වෙන්නේ නැහැ. මේ කුඹුරේ අස්වැන්න කපා ගන්නත් රුපියල් 18,000 විතර මුදලක් ඕනෑ. නමුත් ඒ මුදලටත් වී තියෙයිද කියලා හිතන්න බෑ. මේ වෙච්චි පාඩුව තවත් අවුරුදු 7 ක 8 ක් කුඹුරු කළත් අපිට පියවගන්න වෙන්නේ නැහැ. රසායනික පොහොර සහ තෙල් තහනමත් එක්ක ගොවිතැන් කරලා ජීවත් වුණු අපි පුදුම අමාරුවක තමයි වැටුණේ.



ගස් මැරී ගිය පේර වගාවක්



ඉල් මැස්සාගෙන් හානි වූ පේර



පුරන්වන කුඹුරු යායක්

**ඉපලෝගම ගොඩයාය ගම්වාසී බී.කේ.එල් අජිත් වික්‍රමසිංහ මහතා:**

කලින් විවිධ ගොවිතැන් කළා. මීට අවුරුදු හයකට විතර කලින් පේර වගාවට යොමු වුණා. ඉපලෝගම ප්‍රදේශයේ ගොවීන් විශාල ප්‍රමාණයක් අක්කර සිය ගණනක පේර වගා කරනවා. මමත් අක්කර හතරක විතර ප්‍රමාණයක හොඳ පේර වගාවක් කරගෙන ආවා. මේ කාලය තුළ මේ වගාවෙන් ලැබෙන ආදයමෙන් තමයි වගාවත් නඩත්තු කරගෙන ගෙදර දොරේ සියලුම කටයුතු කර ගත්තේ. පේර වගාවෙන් ආදයමක් ගන්න නම් දවස් 45න් 45ට රසායනික පොහොර දන්න ඕනෑ. මේ දවස් වල පොහොර නැති නිසා කඩෙන් ගෙනත් කාබනික පොහොර දැම්මා. කුකුල් පොහොර දැම්මා. නමුත් වගාවේ කිසිම වර්ධනයක් වුණේ නැහැ. තෙල් නැති හින්ද ඉල් මැස්සා පාලනය කරගන්න විදිහක් නෑ. හැදෙන ගෙඩියක් කුණුවෙලා විනාශ වෙනවා. පොහොර නැති හින්ද මගේ අක්කර හතරක පේර වගාවේ පහෙන් හතරක් විතරම පේර ගස් මේ වෙනකොට මැරිල ගිහින් ඉවරයි. ගොඩ හේන්වල මෝටර් දගෙන වතුර ගහලා වගා කරන අපිට කවදාවත් පොහොර සහනාධාරයක් හම්බවෙලා නෑ. අපිට රුපියල් 5000 කට හරි පොහොර මිටියක් ගන්න තියෙනවා නම් ඒ ඇති. ඉතිරි වෙලා තියෙන වත්තේ පේර ගස් වලින් දැන් සත පහක ආදායමක් නැහැ. අපට දැන් ජීවත් වෙන්න විදිහකුත් නෑ. පේර ගස් තියෙනවා කියලා සමෘද්ධියවත් හම්බ වෙන්නේ නැහැ. ඉඩමේ තැන් තැන්වල එක එක එළවළු ජාති, කෙසෙල් හැදුවා. ඒවත් පොහොර නැතිව ගහක් වත් ලොකු වෙන්නේ නැහැ.

**ගොඩයාය ගම්වාසී නලින් ප්‍රසන්න දයානන්ද මහතා:**

මම ඉතාම සාර්ථකව පේර වගාවක් කරගෙන ආවා. පොහොර නැති හින්ද දවසින් දවසම පේර ගස් මැරෙන්න වුණා. අවසානයේ මුළු පේර වගාව මැරුණා. පස්සේ පේර ගස් ගලවලා දලා දෙළුම් වගාවක් පටන් ගත්තා. මේ වෙනකොට මම ලක්ෂ හත අටක් විතර වගාවට වැය කරලා තියනවා. පොහොර නැති හින්ද වගාවට කාබනික පොහොර තමයි දන්නේ. කඩේ කිලෝ 50ක කාබනික පොහොර මිටියක් රුපියල් දහක් වෙනවා. ඒවා නිකම්ම පස් විතරයි. ගස්වලට දැම්මට කිසිම වැඩක් නෑ. කුකුළු පොහොර ලොරියක් ගෙනාවා. රුපියල් 31000 ක් වැය වුණා. කාබනික පොහොර දලා වගා කරන්න කිව්වට එහෙම කරන්න බෑ කියලා දන්නේ මේ හැමදේම කරලා අත්දැකීම් තියෙන අය විතරයි. මේ වෙනකොට පේර, දෙළුම්, ගස්ලබු, කෙසෙල් හදලා තියෙන ගොවීන් හැමදෙනාම පොහොර ප්‍රශ්නයට මැදිවෙලා තමයි ඉන්නේ. වගාව සම්පූර්ණයෙන්ම අසාර්ථක වෙලා. මේ ගැන කියන්න අපිට කිසිම කෙනෙක් නෑ.

**මහානාම රජ දවස ශ්‍රී ලාංකීය වාරි පද්ධතියට දායාද වූ මානෑව මහවැව මානෑව කඳු පන්තියට මායිම්ව පිහිටි වටිනා වාරි නිර්මාණයකි.**

**1960 දශකයේ දී නිම වූ විශිෂ්ට සිනමා නිර්මාණයක් වූ රෑන ගිරව් සිනමා පටයට පාදක වූ කතාව සහ පසුබිම මානෑව ගම, වැව සහ කඳු පන්ති ආශ්‍රයෙන් නිර්මාණය වූවකි.**

**මානෑව ගම්වාසී ආර්.පී.බී. ප්‍රසන්න රාජකරුණා මහතා:**

මානෑව ගමේ පවුල් 250 ක 1000 කට ආසන්න පිරිසක් ජීවත් වෙනවා. මේ ගමේ වැඩි දෙනෙක් ජීවත් වෙන්නේ ගොවිතැන් කරලා. මානෑව මහවැව යටතේ අක්කර 300 ක් විතර වී වගා කරනවා. මේ වතාවේ වගා කළේ ඒ ප්‍රමාණයෙන් කොටසයි. වගා කරපු හරියත් පොහොර නැතුව අසාර්ථක වෙලා. පහුගිය කාලය ගමේ මහ වැවේ සංවර්ධන කටයුතු කළා. නමුත් ඇළ-වේලි කුඹුරුවලට යන පාරවල් හරියට නෑ. සමහර කුඹුරුවලට කිලෝමීටර් දෙකක් විතර මඩේ බොහොම අමාරුවෙන් තමයි යන්න වෙලා තියෙන්නේ.

**මානෑව ගම්වාසී කේ.පී. සුනිල් මහතා:**

අවුරුදු 40ක කාලයක් කුඹුරු කරලා හේන් කරල තමයි මේ ගම්වල මිනිස්සු එදිනෙදා ජීවත් වෙන්නේ. මම කාගේ හරි අක්කරයක දෙකක කුඹුරු කෑල්ලක් බද්දට අරගෙන කරනවා. බද්ද දීලා වියදම් ඇරලා ඉතිරි වී ටිකෙන් අවුරුද්දක් ජීවත් වුණා. මේ විදිහට තමයි මම මේ කාලේ ජීවත් වුණේ. නමුත් මේ කන්නේ අපට අවුරුද්දත් තියා මාසයක් වත් කන්න වී ටිකක් කුඹුරකින් ගන්න වෙන්නේ නැහැ. ගොයමට තෙල්, පොහොර නැතුව විනාශ වෙලා.

මානෑව සහ ගොඩයය ගම්වාසී ජනතාව ඔවුන් මුහුණ දෙන ගැටලුකාරී තත්ත්වය අප හමුවේ පෙළ ගැසුවේ එලෙසය.

අනුරාධපුර යුගයේ මහානාම රජ දවස ශ්‍රී ලාංකීය වාරි පද්ධතියට දයාද වූ මානෑව මහවැව මානෑව කඳු පන්තියට මායිම්ව පිහිටි වටිනා වාරි නිර්මාණයකි.

1960 දශකයේ දී නිම වූ විශිෂ්ට සිනමා නිර්මාණයක් වූ රෑන ගිරව් සිනමා පටයට පාදක වූ කතාව සහ පසුබිම මානෑව ගම වැව සහ කඳු පන්ති ආශ්‍රයෙන් නිර්මාණය වූවකි.



මානෑව මහ වැව



නිසරු වූ කුඹුරු යාය

සටහන සහ ඡායාරූප
**අනුරාධපුර සමන්ත ලීලාරත්න**

කොළඹ 2 හුණුපිටිය හරස් පාරේ අංක 8 දරන ස්ථානයේ පිහිටි විජය නිවුස්පේපර්ස් ලිමිටඩ් විසින් 2022 මාර්තු මස 13 වැනිදා ඉරිදා එම ස්ථානයේදී මුද්‍රණය කර ප්‍රසිද්ධ කරන ලදී.